**ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
-----------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 2 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 21 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

2014 අයවැය යෝජනා අනුව ක්‍රියාත්මකවූ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ඉදිකළ රු.1,031,437 අගයකට වූ මායිම් තාප්පය හා සභා පරිශ්‍රයේ කුට්ටිගල් ඇතිරීම වෙනුවෙන් කුට්ටිගල් මිලදී ගැනීමට වැයකළ රු.982,017 ක්වූ එකතුව රු.2,013,454 ක වටිනාකම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 770,772 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 60,538 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| බදුකුලී | 3,054 | 2,387 | 62 |
| වෙනත් ආදායම් | 16,088 | 11,355 | 556 |

### 2.2.2 බදු කුලී

ප්‍රාදේශිය සභාවට අයත් කඩකාමර 14 න් සමාලෝචිත වර්ෂය අවසන් දිනට අයවිය යුතු මුදල රු. 62,040 ක් වූ අතර එම හිඟ ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහා මාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශ ලේකම්වරයාගේ 2014 ජුලි 02 දිනැති අංක MPH/HYW/MNG/Cer/ 14 -1 දරන ලිපියේ 01 ඡේදය අනුව මග නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන මාර්ග සඳහා අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ දී අමු ද්‍රව්‍ය මත එකතු කරනු ලබන 10% ක අමතර පිරිවැය එකතු නොකර ඇස්තමේන්තු සකස් කරන ලෙස දක්වා තිබුණද 2014 ජුලි 02 දිනෙන් පසුව සභාව විසින් ගිවිසුම් අත්සන්කර ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 16 ක් වෙනුවෙන් එසේ කටයුතු නොකිරීම නිසා රු.79,974ක මුදලක් වැඩිපුර ගෙවීම්කර තිබුණි.

(ආ) මගනැඟුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ මාර්ග සඳහා මාර්ගවල පතුලට අඟල් 2 ක් ඝනකමට ගල් කුඩු අතුරා ඇති බව දක්වමින් ගෙවීම් වාර්තා සකස්කර ගෙවීම්කර තිබුණි. 2015 අප්‍රේල් 29 දින කර්මාන්ත 12 ක් සම්බන්ධයෙන් සිදුකළ භෞතික පරීක්ෂාවේදී අඟල් 02 ක් ඝනකමට මාර්ගවල පතුලට ගල්කුඩු යොදා නොමැති බවත් ඊට වඩා අඩු ප්‍රමාණයක් ගල්කුඩු යොදා ඇති බවත් නිරීක්ෂණය විය. සාවද්‍ය ගෙවීම් වාර්තා අනුව එකතුව රු. 217,287 ක මුදලක් වැඩිපුර ගෙවීම්කර ඇතිබව නිරීක්ෂණය විය.

(ඇ) මගනැඟුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මකකර තිබූ කර්මාන්ත 02 ක් සඳහා එම මාර්ග වල පතුලට අඟල් 4 ක් ඝනකමට ABC මිශ්‍රණය හා අඟල් 02 ක් ඝනකමට ගල් කුඩු යොදා ඇති බව දක්වමින් එකතුව රු. 286,388 ක මුදලක් ගෙවීම සඳහා ගෙවීම් වාර්තාවට ඇතුළත්කර ප්‍රතිපූර්ණය සඳහා යවා තිබුණි. ගෙවීම් වාර්තාව අනුව මාර්ගයට යොදා ඇති ABC මිශ්‍රණය හා ගල්කුඩු තට්ටුවේ මුළු ඝනකම අඟල් 6 ක් පමණ විය යුතු වුවත් 2015 අප්‍රේල් 29 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී අඟල් 6 ක් ඝනකමට ABC මිශ්‍රණය හා ගල් කුඩු යොදා නොමැති බවත් ඊට වඩා අඩු ප්‍රමාණයක් ABC මිශ්‍රණය හා ගල්කුඩු යොදා ඇති බවත් නිරීක්ෂණය විය. සාවද්‍ය ගෙවීම් වාර්තා අනුව එකතුව රු.106,303 ක මුදලක් වැඩිපුර ගෙවීම් වාර්තාවට ඇතුළත්ව ඇති බව නිරීක්ෂණය විය.

## 4. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) සේවක ණය පරිපාලනය